දුරකථන/தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister — 2784832, 2784807, 2785617

ලේකම් / செயலாளர் / Secretary — 2784812

කාර්යාලය / அலுவலகம் / Office — 2785141-50, Fax: 2784846

ඊමේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

**අධ්‍යාපන අමාත්‍යාංශය**
**கல்வி அமைச்சு**
**Ministry of Education**

'ඉසුරුපාය', ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ
බත්තරමුල්ල
"இசுருபாயா" ஸ்ரீ ஜயவர்தனபுர கோட்டை
பத்தரமுல்ல
"Isurupaya", Sri Jayawardhanapura Kotte
Battaramulla.


පාසල් කටයුතු හා පෞද්ගලික පාසල් ශාඛාව

මගේ අංකය / எமது இல. / My No. — ED/01/12/02/06/01

ඔබේ අංකය / உமது இல. / Your No. — ...................................

දිනය / திகதி / Date — 2009.06. 08

චක්‍රලේඛ අංක **2008/17(ii)**

පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කොට්ඨාශ භාර නියෝජ්‍ය/ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
රජයේ පාසල්වල හා අනුමත පෞද්ගලික පාසල්වල ප්‍රධානීන් වෙත,

**අ.පො.ස(උසස් පෙළ) පන්තිවලට සිසුන් ඇතුළත් කිරීම.**

අ.පො.ස(උසස් පෙළ) පන්තිවලට සිසුන් ඇතුළත් කිරීම පිළිබඳව නිකුත් කර ඇති 2008.04.30 දිනැති අංක 2008/17 දරණ චක්‍රලේඛයට හා 2008.12.31 දිනැති අංක 2008/17(i) මගින් කරන ලද සංශෝධනයට අමතර වශයෙනි.

02. පෙර වර්ෂවල වාණිජ විෂයය ධාරාව හැදෑරීමට විශේෂ සුදුසුකම් ලෙස සමාජ අධ්‍යයන විෂයට ලබා ගත් සම්මාන සමාර්ථය ද සලකන ලද නිසාත් දැනට නව විෂයය නිර්දේශය යටතේ සමාජ අධ්‍යයන විෂය නොමැති නිසාත් සියළුම සිසුන් පෙනී සිටින විෂයයන් අතරින් සමාජ අධ්‍යයනය විෂයයෙන් බෙදී එන ලද ඉතිහාසය විෂයයට ලබා ගත් සම්මාන සමාර්ථය ද විශේෂ සුදුසුකම් යටතේ සලකා බලන ලෙස සමහර විදුහල්පතිවරුන්, දෙමව්පියන් හා ශිෂ්‍යයන් විසින් ඉල්ලීම් ඉදිරිපත් කර ඇත. එම ඉල්ලීම් සලකා බලා සිසුන්ට වැඩි ඉඩ ප්‍රස්ථා ලබා දීම පිණිස 2009 වර්ෂයේ 12 ශ්‍රේණියට හා මින් ඉදිරියට වාණිජ විෂයය ධාරාවට ඇතුළත්වන සිසුන් සඳහා ඉතිහාසය විෂයයට ලබා ගත් සම්මාන සමාර්ථය ද විශේෂ සුදුසුකම් යටතේ සැලකීමට අධ්‍යාපන අමාත්‍යාංශය තීරණය කර ඇත.

03. ඒ අනුව අංක 2008/17 දරණ චක්‍රලේඛයේ 2.5 (අ) ii හි පළමු ඡේදය පහත සඳහන් පරිදි සංශෝධනය කෙරේ.

නියමිත සම්මාන තුනෙන් එකක් ව්‍යවසායකත්ව අධ්‍යයනයට හෝ ව්‍යාපාර හා ගිණුම්කරණයට හෝ ගණිතයට හෝ ඉතිහාසයට හෝ සමාජ අධ්‍යයනයට හෝ ලබා තිබිය යුතුය.

ඉහත සඳහන් කරන ලද සංශෝධනය අනුව අංක 2008/17 චක්‍රලේඛය මින් ඉදිරියට ක්‍රියාත්මක කළ යුතු බව ද එම චක්‍රලේඛයේ අනෙකුත් කරුණු සියල්ල එලෙසම බලපැවැත්වෙන බව ද අවධාරණය කරමි.

එම්.එම්.එන්.ඩී.බණ්ඩාර
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත්
1. ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපති
2. ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්
3. විභාග කොමසාරිස් ජනරාල්
4. අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
5. විගණකාධිපති
6. අධ්‍යාපන අමාත්‍යාංශයේ සියලුම මාණ්ඩලික නිලධාරීන්
7. රජයේ අනුමත පෞද්ගලික පාසල්වල ප්‍රධානීන්

දුරකථන/தொலைபேசி இல./Telephone Nos.

ඇමතිතුමා / அமைச்சர் / Minister — 2784832

ලේකම් / செயலாளர் / Secretary — 2784811

කාර්යාලය / அலுவலகம் / Office — 2785141-50
Fax: 2784846

විද්‍යුත් තැපෑල/மின்னஞ்சல்/E-mail : isurupaya@moe.gov.lk

ඔබේ අංකය / உமது இல. / Your No. ……………………………

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

"ඉසුරුපාය", ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ, බත්තරමුල්ල
"இசுருபாய", ஸ்ரீ ஜயவர்த்தனபுர கோட்டை, பத்தரமுல்ல
"Isurupaya", Sri Jayawardhanapura Kotte
Battaramulla.

මගේ අංකය / எனது இல. / My No. — ED/01/12/10/06/01.

දිනය / திகதி / Date — 2008.12.31

චක්‍රලේඛ අංක 2008/17 (i)

පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කොට්ඨාශ භාර නියෝජ්‍ය/ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
රජයේ පාසල්වල හා අනුමත පෞද්ගලික පාසල්වල ප්‍රධානීන් වෙත,

## අ.පො.ස.(උසස් පෙළ) පන්තිවලට සිසුන් ඇතුළත් කිරීම

අ.පො.ස.(උසස් පෙළ) පන්තිවලට සිසුන් ඇතුළත් කිරීම පිළිබඳව මීට පෙර නිකුත් කර ඇති 2008.03.07 දිනැති අංක 2008/17 දරණ චක්‍රලේඛයට පහත සඳහන් සංශෝධන ඇතුළත් කරමි.

02. අංක 2008/17 චක්‍රලේඛයේ 2.1 වගන්තිය පහත සඳහන් පරිදි සංශෝධනය විය යුතු ය.

2.1 (අ) පැරණි විෂය නිර්දේශයට අනුකූලව අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී මාතෘ භාෂාව හා ගණිතය ඇතුළුව කර විෂයයන් 06 කින් සමත් විය යුතු අතර ඉන් අවම වශයෙන් විෂයයන් 03 කට සම්මාන සාමාර්ථ හෝ ඊට ඉහළ සාමාර්ථ ලබා තිබිය යුතු ය. ඉහත සඳහන් සුදුසුකම් සපුරාලීම සඳහා අතිරේක විෂයයන් වෙත් ලබන සාමාර්ථ හෝ සම්මාන සාමාර්ථ යොදා ගත නොහැකි ය.

(ආ) 2007 දී හඳුන්වා දුන් නව විෂය නිර්දේශයට අනුකූලව අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගයේ දී මාතෘ භාෂාව හා ගණිතය ඇතුළුව ඕනෑම විෂයයන් 06 කින් සමත්වී තිබිය යුතු අතර ඉන් අවම වශයෙන් විෂයයන් 03 කට සම්මාන සාමාර්ථ හෝ ඊට ඉහළ සාමාර්ථ ලබා තිබිය යුතු ය.

(චක්‍රලේඛයෙහි මූලික සුදුසුකම් සඳහන් වන සියලුම ස්ථානවල දී ඉහත පරිදි සංශෝධනය කළ යුතු ය.)

03. චක්‍රලේඛයේ 2.5 (අ) 1. උප වගන්තිය පහත සඳහන් පරිදි සංශෝධනය විය යුතු ය.

2.5

(අ) කලා අංශය

1. කලා විෂය ධාරාව

2.1 හා 2.2 උප ඡේදවල සඳහන් කර ඇති සම්මාන සාමාර්ථ තුන අතරින් එකක්වත් අ.පො.ස.(උසස් පෙළ) විභාගය සඳහා තෝරා ගන්නා විෂයයකට අදාළ විය යුතු ය.

චිත්‍ර හෝ සංගීතය හෝ නැටුම් හෝ නාට්‍ය හා රංග කලාව හෝ යන කවර හෝ විෂයයක් ඉහත සඳහන් විෂය ධාරාව යටතේ හැදෑරීමට බලාපොරොත්තු වන ශිෂ්‍යයකු අ.පො.ස.(සා.පෙළ) විභාගයේ දී එම අදාළ විෂයයට ම සම්මාන සාමාර්ථයක් ලබා තිබිය යුතු ය. සෞන්දර්ය විෂයයන් දෙකක් හදාරන්නේ නම් ඉන් එක් විෂයයකට අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේදී සම්මාන සාමාර්ථයක් ලබා තිබිය යුතු ය. (ප්‍රායෝගික ක්‍රියාකාරකම් සහිත සෞන්දර්ය විෂයයන් හැදෑරීම සඳහා අවශ්‍ය වන සම්මාන සාමාර්ථයෙහි අවශ්‍යතාව පමණක් ඉහත උප වගන්ති 2.3 අනුව ද සපුරා ගත හැකි ය.)

ඉහත සඳහන් කරන ලද සංශෝධන අනුව අංක 2008/17 චක්‍රලේඛය මින් ඉදිරියට ක්‍රියාත්මක කළ යුතු බව ද එම චක්‍රලේඛයේ අන්තර්ගත කරුණු සියල්ල එලෙසම බලපැවැත්වෙන බව ද අවධාරණය කරමි.

එම්.එම්.එන්.ඩී.බණ්ඩාර
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත් :

1. ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපති
2. ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්
3. විභාග කොමසාරිස් ජනරාල්
4. අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
5. විගණකාධිපති
6. අධ්‍යාපන අමාත්‍යාංශයේ සියලුම මාණ්ඩලික නිලධාරීන්
7. රජයේ අනුමත පෞද්ගලික පාසල්වල ප්‍රධානීන්

දුරකථන /தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister } 2784832 Fax: 2784825

ලේකම් / செயலாளர் / Secretary } 2784812

කාර්යාලය / அலுவலகம் / Office } 2785141-50 Fax: 2784846

ඊමේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

ඔබේ අංකය / உமது இல. / Your No. } ........................

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

"ඉසුරුපාය"
බත්තරමුල්ල.

'இசுருபாய'
பத்தரமுல்ல.

"Isurupaya"
Battaramulla.

මගේ අංකය / எமது இல. / My No. } පාසල් කටයුතු හා පෞද්ගලික පාසල් ශාඛාව ED/01/12/10/06/01

දිනය / திகதி / Date } 2008.04 30

(4)

**චක්‍රලේඛ අංක : 2008/17**

පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
කොට්ඨාස භාර නියෝජ්‍ය/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
රජයේ පාසල්වල හා අනුමත පෞද්ගලික පාසල්වල ප්‍රධානීන් වෙත

## අ.පො.ස. (උසස් පෙළ) පන්තිවලට සිසුන් ඇතුළත් කිරීම

පාසල්වලට ළමයින් ඇතුළත් කිරීම සම්බන්ධයෙන් මීට පෙර නිකුත් කර ඇති 2006.05.23 දිනැති අංක 2006/20 දරන චක්‍රලේඛයේ I කොටසේ 1.4 හි විධිවිධාන හා V කොටසෙහි සියලු විධිවිධාන අභිබවා මෙම චක්‍රලේඛයේ උපදෙස් 2008 මැයි 01 වැනි දින හා ඉන්පසු ව අ.පො.ස. (උසස් පෙළ) පන්තිවලට සිසුන් ඇතුළත් කිරීමේ දී බලපානු ඇත.

### 2.0 12 ශ්‍රේණියට ඇතුළත්වීම සඳහා සාමාන්‍ය සුදුසුකම්

2.1. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙ.) විභාගයේ දී මාධ්‍ය භාෂාව හා ගණිතය ඇතුළු ව හය විෂයයන් 6කින් සමත් විය යුතු අතර, ඉන් අවම වශයෙන් විෂයයන් තුනකට සම්මාන සාමාර්ථ ලබා තිබිය යුතු ය. ඉහත සඳහන් සුදුසුකම් සපුරාලීම සඳහා අතිරේක විෂයයන්ගෙන් ලබන සාමාර්ථ හෝ සම්මාන සාමාර්ථ හෝ යොදා ගත නොහැකි ය.

2.2. මෙම සුදුසුකම් වරක දී හෝ දෙවරක දී වුව ද ලබා ගත හැකි ය.

(අ) දෙවරක දී මෙම සුදුසුකම් ලබා ගන්නා ශිෂ්‍යයකු විසින් ඉදිරිපත් කරනු ලබන අ.පො.ස. (සා.පෙ.)ප්‍රතිඵල සහතික දෙකෙන් මුල් ප්‍රතිඵල සහතිකයේ අවම වශයෙන් සම්මාන සාමාර්ථ 3ක් සහිත ව මාධ්‍ය භාෂාව හෝ ගණිතය ඇතුළු ව හය විෂයයන් 5කින් සමත් වී තිබිය යුතු ය.

(ආ) අ.පො.ස. (සා.පෙ.) විභාගයෙන් අවම වශයෙන් සම්මාන සාමාර්ථ 3ක් සහිත ව මාධ්‍ය භාෂාව හෝ ගණිතය ඇතුළු ව හය විෂයයන් 5ක් සමත් වූ ප්‍රතිඵල ලේඛනයක් ඉදිරිපත් කරන ශිෂ්‍යයකු ඊළඟට පැවැත්වෙන අ.පො.ස. (සා.පෙ.) විභාගයේ දී ම නියමිත සුදුසුකම් සම්පූර්ණ කර ගැනීමේ කොන්දේසිය මත තාවකාලික ව අ.පො.ස. (උ.පෙ.) පන්තියට ඇතුළත් කර ගත හැකි ය. එසේ ඇතුළත් කරගනු ලබන ශිෂ්‍යයකු ඉහත සඳහන් කර ඇති සුදුසුකම් ඊළඟට පැවැත්වෙන අ.පො.ස. (සා.පෙ.) විභාගයේ දී ම ලබා නොගතහොත් පාසලින් ඉවත් කරනු ලැබේ. කෙසේ වෙතත් නැවත, ප්‍රතිඵල සමීක්ෂණයට ඉල්ලා ඇත්නම් එම ප්‍රතිඵල එනතුරු පමණක් පාසලේ රැඳී සිටිය හැකි ය.

2.3. ඉහත 2.1 උපඡේදයෙහි දැක්වෙන අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් යටතේ අවශ්‍ය වන සම්මාන සාමාර්ථ තුනෙන් එකක් නොමැති අවස්ථාවක පමණක් අ.පො.ස.(සා.පෙ.) ලිඛිත පරීක්ෂණයේ සාමාන්‍ය සාමාර්ථයක් ලබා එම විෂයට ම පාසල පදනම් කරගත් ඇගයීම් වැඩපිළිවෙල යටතේ සම්මාන හෝ ඊට ඉහළ නිපුණතා මට්ටම් ලබා ඇත්නම් එය එක් සම්මාන සාමාර්ථයක් ලෙස සලකනු ලැබේ. එහෙත් මෙය මාධ්‍ය භාෂාව හා ගණිතය යන විෂයයන් සඳහා අදාළ නොවේ.

/........ 02

2.4. පාසල් සිසුවෙකු ලෙස මුල් ප්‍රයත්නයෙන් පසුව අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාග ප්‍රතිඵල ලබා ගන්නා සිසුවකුට ද ඉහත 2.3 උප ඡේදය අනුව සම්මාන සාමාර්ථ සපුරා ගත හැකි ය. එයට මුල් ප්‍රයත්නයේ දී ලබා ගත් පාසල් පදනම් කර ගත් ඇගයීම් ප්‍රතිඵල යොදා ගත හැකි ය.

2.5 **12 ශ්‍රේණියේ විෂය ධාරාවලට ඇතුළත් වීම සඳහා අවශ්‍ය විශේෂ සුදුසුකම්**

ඉහත සඳහන් සාමාන්‍ය සුදුසුකම්වලට අතිරේක ව ඒ ඒ විෂය ධාරාවලට ඇතුළු වීම සඳහා පහත සඳහන් අනු ඡේදවල දක්වා ඇති විශේෂ සුදුසුකම් ද එක ම විභාගයක දී සපුරා තිබිය යුතු ය.

(අ) **කලා අංශය**

1. **කලා විෂය ධාරාව**

2.1 හා 2.2 උප ඡේදවල සඳහන් කර ඇති සම්මාන සාමාර්ථ තුන අතරින් එකක්වත් අ.පො.ස.(උ.පෙළ) විභාගය සඳහා තෝරා ගන්නා විෂයයකට අදාළ විය යුතු ය.

චිත්‍ර හෝ සංගීතයට හෝ නැටුම්වලට හෝ නාට්‍ය හා රංග කලාව යන කවර හෝ විෂයයක් ඉහත සඳහන් විෂය ධාරාව යටතේ හැදෑරීමට බලාපොරොත්තු වන ශිෂ්‍යයකු අ.පො.ස.(සා.පෙ) විභාගයේ දී එම අදාළ විෂයයට ම සම්මාන සාමාර්ථයක් ලබා තිබිය යුතු ය. (ප්‍රායෝගික ක්‍රියාකාරකම් සහිත සෞන්දර්ය විෂයයන් හැදෑරීම සඳහා අවශ්‍ය වන සම්මාන සාමාර්ථයෙහි අවශ්‍යතාව පමණක් ඉහත 2.3 අනුව ද සපුරාගත හැකි ය).

11. **වාණිජ විෂය ධාරාව**

නියමිත සම්මාන තුනෙන් එකක් ව්‍යවසායකත්ව අධ්‍යයනයට හෝ ව්‍යාපාර හා ගිණුම්කරණය හෝ ගණිතයට හෝ විය යුතු ය.

**සැ.යු. :** සිංහල/දෙමළ/ඉංග්‍රීසි/ යන කවර හෝ විෂයයක් හදාරන්නේ නම්, අ.පො.ස.(සා.පෙ.) විභාගයේ දී සිංහල භාෂාව හා සාහිත්‍ය/දෙමළ භාෂාව හා සාහිත්‍ය/ඉංග්‍රීසි යන විෂයයන්ගෙන් අදාළ විෂයයකට සම්මාන සාමාර්ථයක් ලබා තිබිය යුතු ය. එමෙන්ම යම් ආගමක් හෝ යම් ආගමක ශිෂ්ඨාචාරයක් විෂයයක් ලෙස ඉහත අංශය යටතේ හැදෑරීමට බලාපොරොත්තු වන සිසුවෙකු අ.පො.ස.(සා.පෙ) විභාගයේ දී එම අදාළ ආගම් විෂයයට සම්මාන සාමාර්ථයක් ලබා තිබිය යුතු ය.

(ආ) **විද්‍යා අංශය**

1. **භෞතික විද්‍යා විෂය ධාරාව**

මේ විෂය ධාරාව හැදෑරීම සඳහා ගණිතය විෂයයට සම්මාන සාමාර්ථයක් තිබිය යුතු අතර විද්‍යාව විෂය සමත් වී තිබිය යුතු ය.

11. **ජෛවීය විද්‍යා විෂය ධාරාව**

මේ විෂය ධාරාව හැදෑරීම සඳහා විද්‍යාව විෂයයට සම්මාන සාමාර්ථයක් තිබිය යුතු අතර ගණිතය විෂය සමත් වී තිබිය යුතු ය.

2.6. ඉහත දක්වා ඇති සුදුසුකම් නියම කර ඇත්තේ අ.පො.ස.(උ.පෙ.) පන්තිවලට ඇතුළත් කිරීම සඳහා පමණක් බව පාසල් ප්‍රධානීන් අවධානයට ගත යුතු ය. උසස් පෙළ විෂය ධාරාවන්හි දී ඒ ඒ විෂය ධාරාවට අදාළ විෂයයන් තෝරා ගැනීම සම්බන්ධයෙන් මෙම අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති විශ්ව විද්‍යාල ප්‍රවේශය පිළිබඳ අ.පො.ස.(උ.පෙ.) විෂය සංයෝජනය චක්‍රලේඛ නියම අනුව සිය ශිෂ්‍යයන්ට උපදෙස් දීම පාසල් ප්‍රධානීන්ගේ වගකීම වේ.

**3.0.** දොළොස්වැනි ශ්‍රේණියට ඇතුළත් වීමෙන් පසු ව තමන් තෝරා ගත් විෂය ධාරාව වෙනස් කිරීමට ඉල්ලා සිටින ශිෂ්‍යයකුට උසස් පෙළ පන්තියට ඇතුළත් වූ වර්ෂයේ දී පමණක් අවශ්‍ය සුදුසුකම් හා පන්තිවල පුරප්පාඩු තිබේ නම් එසේ කිරීමට ඉඩ දිය හැකි ය. එසේ ඉඩ දෙනු ලබන්නේ අ.පො.ස.(උ.පෙ.) පන්තිවල රැඳී සිටීමට උපරිම වශයෙන් ශිෂ්‍යයෙකුට ලැබෙන කාල සීමාව වර්ෂ තුනක් පමණක් ය යන කොන්දේසිය මත ය. අනතුරු ව පැවැත්වූ අ.පො.ස.(සා.පෙ.) විභාගයක ප්‍රතිඵල මත හෝ 13 ශ්‍රේණියේ දී හෝ විෂය ධාරාව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

{ . . . . . . . 03

## 4.0. 12 ශ්‍රේණියට සිසුන් ඇතුළත් කිරීමේ ප්‍රමුඛතාව

4.1 අ.පො.ස. (උ.පෙ.) (12 ශ්‍රේණි) පන්තිවලට සිසුන් ඇතුළත් කිරීම සඳහා තෝරා ගැනීමේ ප්‍රමුඛතාව පහත දැක්වෙන පරිදි විය යුතු ය.

(අ) එම පාසලේ අපේක්ෂකයන් ලෙස විභාගයට පෙනී සිටි සිසුන් (චක්‍රලේඛයේ 2.0 වගන්තිය යටතේ සඳහන් එක් එක් විෂය ධාරාවට තිබිය යුතු අවම සුදුසුකම් සපුරා ගෙන ඔවුන් එම විෂයධාරාව ඉල්ලුම් කළහොත් එය අනිවාර්යයෙන් ම ලබාදිය යුතු ය).

(ආ) අ.පො.ස. (උ.පෙ.) පන්ති නොමැති රජයේ පාසල්වලින් හෝ අදාළ විෂයධාරා නොමැති රජයේ පාසල්වල සිසුන් (ජාතික පාසලකට සිසුන් ඇතුළත් කිරීමේ දී එම පාසල අයත් කලාපය තුළ උසස් පෙළ පන්ති නොමැති හෝ අදාළ විෂය ධාරාව හෝ ශිෂ්‍යා/ශිෂ්‍යාව ඉල්ලුම් කරන විෂය සංයෝජනය හෝ නොමැති ජාතික පාසල් නොවන පාසල්වලින් අයදුම් කරන සිසුන්ට ප්‍රමුඛතාව ලබා දිය යුතු ය).

(ඇ) පිළිගත හැකි සාධාරණ හේතු ඉදිරිපත් කරන විෂය ධාරා තිබෙන වෙනත් රජයේ පාසල්වල සිසුන්

(ඈ) අ.පො.ස. (සා.පෙ.) විභාගයට සමාන්තර සුදුසුකම් සහිත ප්‍රතිඵල ලබා ඇති (අපගේ' විෂය සංයෝජනවලට අනුකූල වන පරිදි) විදේශගත ව සිට පැමිණෙන සිසුන් (සහතිකවල සමාන්තර භාවය පැහැදිලි නොවන විට අමාත්‍යාංශ ලේකම්ගේ උපදෙස් අනුව කටයුතු කළ යුතු යි).

(ඉ) අ.පො.ස.(උ.පෙ.) පන්ති නොමැති හෝ අදාළ විෂයධාරා නොමැති ජාතික විෂය මාලාව උගන්වන පෞද්ගලික පාසල්වල සිසුන්. (අදාළ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් ඉල්ලුම් කළ යුතු ය.)

4.2 ඉහත සඳහන් ප්‍රමුඛතා ලේඛනයේ ඉහලින් ඇති කරුණුවලට අදාළව ඉල්ලුම් කරන ලද සිසුන් නොමැති වූ විට පමණක් ඊළඟ කරුණු ගැන සළකා බැලිය යුතු ය. (උදා : ඉහත 4.1 (අ) හි සඳහන් සිසුන් ඇතුළත් කිරීමෙන් පසුව පුරප්පාඩු පවතී නම් පමණක් (ආ) සලකා බැලිය යුතු ය).

4.3 අ.පො.ස. (උ.පෙ.) පන්තියට ඇතුළත් වීමට සුදුසුකම් ලබා 12 ශ්‍රේණියට ඇතුළත් වීමට බලාපොරොත්තු වන සිසුන් ඊළඟ අවුරුද්දේ ජනවාරි 31 වන දිනට අවුරුදු 19 නොඉක්මවා සිටිය යුතු ය. මේ කොන්දේසිය 4.1 (අ) උප වගන්තියේ සඳහන් සිසුන්ට අදාළ නොවේ.

4.4 සිසුන් ඇතුළත් වූ වර්ෂයට පසු වර්ෂයේ ජනවාරි 31 ට වයස අවුරුදු 19 ට වැඩි සිසුන් පිළිගත හැකි හේතු සමග, ඇතුළත් කිරීමට අනෙකුත් සුදුසුකම් සම්පූර්ණ කර ඇති බව විදුහල්පතිගේ නිර්දේශය සහිත ව කරන ඉල්ලීම් පළාත් පාසල් සම්බන්ධයෙන් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ද, ජාතික පාසල් සම්බන්ධයෙන් මේ අමාත්‍යාංශයේ ලේකම් විසින් ද තීරණය කරනු ඇත.

4.5 ඉහත 4.1 උප වගන්තියේ (ආ) සිට (ඉ) දක්වා සිසුන් තම අයදුම්පත්‍ර මේ චක්‍රලේඛයේ අංක.01 උප ලේඛනයට අනුව අදාළ විදුහලේ විදුහල්පති වෙත ඉදිරිපත් කළ යුතු ය. අයදුම් කිරීමේ දී තමන් කැමති පාසල් 04ක් අනුපිළිවෙළින් නම් කළ යුතු අතර එම පාසල්වලට ද වෙන වෙන ම ඉල්ලුම් පත්‍ර එවිය යුතු ය.

**සැ.යු. :** අ.පො.ස. (සා.පෙ) ප්‍රතිඵල මත වෙනත් පාසලකට ඇතුළත් වීම සඳහා ඉල්ලුම් කිරීමට සිසුන්ට අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා විදුහල්පතිවරුන් විසින් ඉඩ ලබාදිය යුතු අතර අයදුම් කරන තම පාසලේ සිසුන්ගේ අයදුම්පත් සුදුසු නිර්දේශ (තම පාසලේ උසස් පෙළ විෂය ධාරා හා පහසුකම් තිබේ ද යන්න ආදී) ලබා දී අනිවාර්යයෙන් සහතික කළ යුතු ය.

4.6 අ.පො.ස. (උ.පෙ) පන්තිවලට ඇතුළත් වීම සඳහා ඉදිරිපත් කරනු ලබන සියලුම අයදුම්පත් ඉහත 4.1 වගන්තියේ (ආ) සිට (ඉ) දක්වා උපවගන්තිවලට අනුව වෙන වෙන ම ලේඛනගත කොට උපලේඛන අංක 2 හි සඳහන් ලකුණු දීමේ ක්‍රමය අනුව තෝරා ගැනීම කළ යුත ු ය. ලකුණු දීමේ ක්‍රමය අ.පො.ස. (සාමාන්‍ය පෙළ ) ප්‍රතිඵල හා විෂය සමගාමී ක්‍රියාකාරකම් පදනම් කර ගෙන සකස් කර ඇත. එම උපදෙස් අනුව කටයුතු කිරීමේ සම්පූර්ණ වගකීම පාසල් ප්‍රධානීන් වෙත පැවරේ.

4.7 අ.පො.ස. (උ.පෙළ) 12 ශ්‍රේණියට සිසුන් තෝරා ගැනීමේ දී තමන්ගේ පාසලේ සිසුන්ට ද අනෙකුත් පාසල්වල සිසුන්ට ද පාසල විසින් කිසිම විභාගයක් නොපැවැත්විය යුතු ය.

## 5.0. සුදුසුකම්ලත් සිසුන්ට පාසල් ලබා දීම

5.1. අ.පො.ස. (උ.පෙ.) අදාළ විෂය ධාරා නොමැති පාසල්වල සුදුසුකම් ලත් සියලු ම සිසුන්ට අ.පො.ස.(උ.පෙ.) පන්ති ඇති පාසල්වලට ඇතුළු වීමට ඉඩ සලසා දීම, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ / පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ වගකීම වේ.

5.2. යම් පාසලක උසස් පෙළ පන්තිවලට අදාළ විෂය ධාරාව ඉගැන්වීම සඳහා අවශ්‍ය ගුරුවරු හා භෞතික පහසුකම් සපුරා නොමැති අවස්ථාවක දී අදාළ විෂයධාරාවට සුදුසුකම් ලබන එම විදුහලේ සිසුන් අදාළ පහසුකම් සහිත වෙනත් පාසලකට / පාසල්වලට ඇතුළත් කිරීම සඳහා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ / පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් පියවර ගත යුතු ය.

5.3. යම්කිසි පාසලක අ.පො.ස. (සා.පෙ) විභාගයට විෂය කිහිපයක් ඉංග්‍රීසි මාධ්‍යයෙන් පෙනී සිට සමත් වූ සිසුන් අ.පො.ස. (උසස් පෙළ) සඳහා එම විෂය අතරින් එකක් හෝ කිහිපයක් ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගෙනීමට ඉල්ලුම් කලහොත් එම විදුහලේ ම එම විෂය/ විෂයයන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගැන්වීමට ඉඩ පහසුකම් තිබේ නම් ඒ සඳහා ඉඩ ලබාදිය යුතු ය. නොඑසේනම් විදුහල්පති විසින් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඔවුන් යොමු කළ යුතු ය. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ සමඟ සාකච්ඡා කොට අදාළ සිසුන් සඳහා කලාපය තුළ හෝ පළාත තුළ අවශ්‍ය පහසුකම් සහිත පාසලක් ලබා දිය යුතු ය.

**සැ.යු :** අ.පො.ස. (උ.පෙ) පන්තියකට ඇතුළත් කළ හැකි උපරිම ශිෂ්‍ය සංඛ්‍යාව 40කි.

## 6.0 අ.පො.ස. (උ.පෙ) හැදෑරීම සඳහා පහසුකම් සහිත දිස්ත්‍රික්කවලින් දුෂ්කර දිස්ත්‍රික්කවල පාසල්වලට පැමිණීම

6.1 විශ්ව විද්‍යාල ප්‍රවේශයේ දී නම් කර ඇති දුෂ්කර දිස්ත්‍රික්ක සඳහා ලබා දී ඇති සහනය වංක ලෙස ලබා ගැනීමේ අරමුණින් පහසුකම් සහිත දිස්ත්‍රික්කවලින් අ.පො.ස.(සාමාන්‍ය පෙළ) සමත් වී දුෂ්කර දිස්ත්‍රික්කය තුළ උසස් පෙළ පන්ති සහිත පාසල්වලට ඇතුළත් වීමට උත්සාහ කරන සිසුන්ට ඉඩ ලබා නොදිය යුතු ය.

6.2 එහෙත් පහත සඳහන් විශේෂිත හේතු මත එවැනි ඉල්ලීමක් ඉදිරිපත් වුවහොත් ඒ පිළිබඳ සලකා බැලිය යුත්තේ ලිපිලේඛන ඉදිරිපත් කර අදාළ කරුණු තහවුරු කරන්නේ නම් පමණි. මේ පිළිබඳ ව සත්‍ය වශයෙන් ම අදාළ ප්‍රදේශයේ තම පවුලේ සාමාජිකයන් සමග පදිංචි වී සිටින බව විදුහල්පති විසින් පදිංචි ස්ථානයට ගොස් පරීක්ෂා කර සනාථ කර ගත යුතු ය.

(අ) **රජයේ අවශ්‍යතා මත දෙමාපියන්ගේ ස්ථාන මාරු හේතු කොට :**

මෙම හේතුවෙන් ඇතුළත් වීම සිදු කළ යුතු වන්නේ ස්ථාන මාරු වීමෙන් පසු තම පවුලේ සාමාජිකයන් සමග නව සේවා ස්ථානයට ආසන්න ප්‍රදේශයකට සත්‍ය වශයෙන් ම තම පදිංචිය වෙනස් කර තිබේ නම් පමණි. එසේ පදිංචිය වෙනස් කර තිබීම පිළිබඳ ව අදාළ ලිපි ලේඛන තම ආයතන ප්‍රධානියා අදාළ ප්‍රදේශයෙහි ග්‍රාම නිලධාරී මගින් ප්‍රාදේශීය ලේකම් ද සහතික කර දෙමාපියන් විසින් ඉදිරිපත් කළ යුතු ය.

(ආ) **ආරක්ෂක හේතූන් මත :**

මේ හේතුවෙන් දෙමව්පියන්ගේ පදිංචිය වෙනස් කිරීමක් සිදු කර ඇත්නම්, ආරක්ෂාව සඳහා පදිංචිය වෙනස් කර ඇති බවට අදාළ ප්‍රදේශයේ පොලිස් ස්ථානාධිපතිවරයාගෙන් ලබා ගත් සහතික ඉදිරිපත් කළ යුතු ය.

## 7.0 අ.පො.ස. (උ.පෙ) පන්තිවල ඉගෙනුම ලැබිය හැකි කාල සීමාව

7.1 අ.පො.ස. (උ.පෙ) පාඨමාලාව 12 වැනි ශ්‍රේණිය සහ 13 වැනි ශ්‍රේණිය යනුවෙන් දෙවුරුදු කාල සීමාවකට සීමා වේ.

7.2 දහතුන්වැනි ශ්‍රේණියේ සෑම ශිෂ්‍යයකු ම එම වසර අවසානයේ දී, නියම කර ඇති මූලික අවශ්‍යතා සපුරා ඇත්නම් අ.පො.ස. (උ.පෙ) විභාගයට ඉදිරිපත් කළ යුතු ය.

7.3 ශිෂ්‍යයකුට නැවත වරක් අ.පො.ස. (උසස් පෙළ) විභාගයට පෙනී සිටීමට අවශ්‍ය වන්නේ නම් දහතුන්වැනි ශ්‍රේණියේ පාඨමාලාව නැවත එක් වරක් පමණක් හැදෑරීමට අවසර දිය හැකි ය. එහෙත් අ.පො.ස (උ.පෙ) පන්තිවල රැඳී සිටීමට උපරිම වශයෙන් ශිෂ්‍යයකුට ලැබෙන කාල සීමාව වර්ෂ තුනක් බව සැලකිය යුතු යි.

/.......05

**8.0** 2005 වර්ෂයේ සිට උසස් පෙළ විභාගයට පෙනී සිටින පාසල් අයදුම්කරුවන් සඳහා පාසල පදනම් කරගත් ඇගයීම් ක්‍රියාවලිය අනිවාර්ය කොට ඇත. උසස් පෙළ විභාගයට පෙනී සිටින බාහිර අයදුම්කරුවන් සඳහා ද මීට සමාන්තර විකල්ප ඇගයීම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වේ. ඒ සඳහා විභාගයට පෙනී සිටින වර්ෂයට පෙර වර්ෂයේ පුවත්පත් නිවේදනය මගින් දැනුම් දෙන දිනයට පෙර අදාළ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවල ලියාපදිංචි විය යුතු ය. මේ පිළිබඳ ව සෑම වර්ෂයක ම පුවත්පත් මගින් බාහිර අයදුම්කරුවන් දැනුවත් කරනු ඇත. මේ විකල්ප ක්‍රියාවලිය සම්බන්ධ ව අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතු වේ.

## 9.0 පොදු කරුණු

9.1 අ.පො.ස.(උසස් පෙළ) පන්තියකට ඇතුළත්වූ ශිෂ්‍යයෙක්/ශිෂ්‍යාවක් පිළිගත හැකි සාධාරණ හේතු ඉදිරිපත් කරන්නේ නම් පමණක් එක් පාසලකින් තවත් පාසලකට ඇතුළත් වීමට අනුමැතිය ලබා දිය හැකි ය. එහෙත් දිස්ත්‍රික්කයෙන් වෙනත් දිස්ත්‍රික්කයක පාසලකට ඇතුළත් වීමට බලාපොරොත්තු වන්නේ නම් සත්‍ය වශයෙන්ම පදිංචිය වෙනස් කළ හා 6.0 වගන්තියේ සඳහන් කරුණුවලට පටහැනි නොවන්නේ ද යන්න පරීක්ෂා කර බලා අනුමැතිය ලබා දිය යුතුය. මෙහි දී ඇතුළත්වීමට බලාපොරොත්තු වන පාසලේ විදුහල්පතිගේ නිර්දේශය මත ජාතික පාසලක් නම් ජාතික පාසල් අධ්‍යාපන අධ්‍යක්ෂ ගේ ද පළාත් පාසලක් නම් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ ගේ ද අනුමැතිය දෙමව්පියන් විසින් ලබා ගත යුතුය.

9.2 ත්‍රස්තවාදී ක්‍රියා හේතු කොට ගෙන අවතැන් වූ පවුල්වල දරුවන් පාසල්වලට ඇතුළත් කිරීමේ දී උප්පැන්න සහතික, අස්වීමේ සහතික ආදිය ද නොමැති වූ විට, එකී පවුල් ත්‍රස්තවාදී ක්‍රියාවලට භාජන වූ බවට ග්‍රාම නිලධාරී සහතිකය, අනාථ කඳවුරු සහතිකය ආදිය සලකා බලා සුදුසු පරිදි අදාළ ශ්‍රේණියට ඇතුළත් කර ගැනීමට කටයුතු කළ යුතු ය. උප්පැන්න සහතිකය ඉදිරිපත් කළ නොහැකි අවස්ථාවල දී උපන් දිනය සනාථ කිරීම සඳහා දිවුරුම් ප්‍රකාශයක් ලබා ගත හැකි ය.

9.3 රජයට පවරා ගන්නා පාසල්වල පුරප්පාඩු පිරවීමේ දී පවරා ගන්නා අවස්ථාවේ තත් පාසලේ සිටි ආගමික සිසු අනුපාතය ගැන සැලකිලිමත් විය යුතු ය. යම් ආගමක එක් කොටසකට වෙන් කරන ලද ප්‍රමාණයට අඩු අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඇති කල්හි එම පුරප්පාඩු සෙසු ආගමික කොටස් අතර අනුපාතික ව බෙදා හැරිය යුතු ය.

10.0 අ.පො.ස. (උසස් පෙළ) පන්තිවලට ඇතුළත් කිරීම සඳහා සෑම වර්ෂයකම මැයි 20 වැනි දිනට ප්‍රථම අයදුම්පත් කැඳවිය යුතු අතර සිසුන් ඇතුළත් කිරීමේ කටයුතු ජුනි මස 15 වැනි දින වන විට නිම කල යුතුය.

## 11.0 ළමයින් ඇතුළත් කිරීම සඳහා මුදල් සහ වෙනත් ආධාර ලබා ගැනීම තහනම් කිරීම.

සියලු ම රජයේ පාසල් හා ගාස්තු අය නො කරන පෞද්ගලික පාසල්වලට සිසුන් ඇතුළත් කිරීමේ දී පහසුකම් හා සේවා ගාස්තු සහ පාසල් සංවර්ධන සමිති සාමාජික මුදල හැර වෙනත් ගාස්තු හෝ ආධාර මුදල් හෝ වෙනයම් බඩු බාහිරාදියක් හෝ අය කිරීම/ලබා ගැනීම සම්පූර්ණයෙන් ම තහනම් වේ. සිසුන් ඇතුළත් කිරීමෙන් පසුව ද එවැනි බලපෑමක් නො කළ යුතු වේ. මෙලෙස බලපෑම් කිරීම සම්පූර්ණයෙන් ම නීති විරෝධී වන අතර එවැනි අවස්ථාවල ඒ සම්බන්ධ ව දැඩි ලෙස ක්‍රියා කිරීමට සිදු වනු ඇත. පාසල් ප්‍රධානීන් හෝ පාසලට සම්බන්ධ වෙනත් කවර සංවිධානයක් හෝ එලෙස බලපෑම් නො කළ යුතු ය. මෙහි දී සංවිධාන යන්නෙන් ආදි ශිෂ්‍ය සංගම්, පාසල් සංවර්ධන සමිති ඇතුළු පාසලට සම්බන්ධ වූ සියලු ම සමිති හා සංගම් අදහස් කෙරේ.

මේ චක්‍රලේඛයෙන් පැන නගින ඕනෑ ම ගැටලුවක් සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වනු ඇත.

එම්.එම්.එන්.ඩී.බණ්ඩාර
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත් :
1. ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපති
2. ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්
3. විභාග කොමසාරිස් ජනරාල්
4. අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
5. විගණකාධිපති
6. අධ්‍යාපන අමාත්‍යාංශයේ සියලු ම මාණ්ඩලික නිලධාරීන්
7. අධ්‍යාපන අමාත්‍යාංශයේ සියලු ම ශාඛා ප්‍රධානීන්
8. රජයේ අනුමත පෞද්ගලික පාසල්වල ප්‍රධානීන්

උපලේඛන අංක.01.

**20......... වර්ෂයේදී ............................................................ විද්‍යාලයේ**

## අ.පො.ස.(උසස් පෙළ) පංතියට ඇතුළත් වීම සඳහා අයදුම්පත්‍රය

1. ශිෂ්‍යයාගේ / ශිෂ්‍යාවගේ සම්පූර්ණ නම : ..............................................................................
   මුලකුරු සමඟ නම : ..............................................................................
2. ස්ථිර ලිපිනය : ..............................................................................
3. ස්ත්‍රී/පුරුෂ භාවය : ..............................................................................
4. ඉගැන්වීමේ මාධ්‍ය : ..............................................................................
5. මව/පියා/භාරකරුගේ ලිපිනය : ..............................................................................
6. උපන් දිනය : ..............................................................................
7. 20..... ජනවාරි 31 දිනට වයස : අවුරුදු........... මාස ......... දින ...........
8. අ.පො.ස. (සා.පෙ) ඉගෙනුම ලැබූ පාසලේ ලිපිනය හා ඇතුළත් වීමේ අංකය : ..................................
9. එම පාසල පිහිටි දිස්ත්‍රික්කය :..............................................................................
10. විෂය සමගාමී ජයග්‍රහණ : ..............................................................................

11. **අ.පො.ස. (සා.පෙළ) විභාග ප්‍රතිඵල :**

**පළමු ප්‍රතිඵල**
වර්ෂය : ..............
විභාග අංකය : .....................

**දෙවන ප්‍රතිඵල**
වර්ෂය : ........ ...........
විභාග අංකය : ..................

| විෂයය | ශ්‍රේණිය (සංකේත) | පාසල් පදනම් කරගත් ඇගයීම් නිපුණතා මට්ටම (සංකේත) | ශ්‍රේණිය (දෙවන ප්‍රතිඵල) |
|---|---|---|---|
| 1. සිංහල භාෂාව හා සාහිත්‍ය/ | ......... | ............ | ............ |
| දෙමළ භාෂාව හා සාහිත්‍ය | ......... | ............ | ............ |
| 2. ඉංග්‍රීසි | ......... | ............ | ............ |
| 3. ගණිතය | ......... | ............ | ............ |
| 4. විද්‍යාව | ......... | ............ | ............ |
| 5. ................ | ......... | ............ | ............ |
| 6. ................ | ......... | ............ | ............ |
| 7. ................ | ......... | ............ | ............ |
| 8. ................ | ......... | ............ | ............ |
| 9. ................ | ......... | ............ | ............ |
| 10. ................ | ......... | ............ | ............ |

(ශ්‍රේණි සංකේත පිළිබඳ විස්තර : A විශිෂ්ට, B අධි සම්මාන, C සම්මාන, S සාමාන්‍ය , W දුර්වල සාමාර්ථ වේ. )

(පාසල් පදනම් කර ගත් ඇගයීම් නිපුණතා මට්ටම සංකේත 1 - විශිෂ්ට මට්ටම, 2 - ඉහල මට්ටම, 3 – සම්මාන මට්ටම, 4 – ආසන්න මට්ටම, 5 - නිපුණතා මට්ටමට ළඟා නොවීම)

10. ඇතුළත් වීමට බලාපොරොත්තු වන විෂය ධාරාව : කලා/වාණිජ්‍ය/ජෛවීය විද්‍යා/භෞතිය විද්‍යා

i. අ.පො.ස.(උසස් පෙළ) ඉගෙනීමට අදහස් කරන විෂයයන් :

| විෂයය | මාධ්‍යය |
|---|---|
| 1. .................................... | ............. |
| 2. .................................... | ............. |
| 3. .................................... | ............. |
| 4. .................................... | ............. |

11. කැමැත්ත හා ළඟා වීමේ පහසුව අනුව තව පාසල් 04ක් (ඉල්ලුම් කරන අදාළ පාසල ද සමඟ) නම් කරන්න.

| පාසල | ලිපිනය |
|---|---|
| 1. ................................ | ........................................... |
| 2. ................................ | ........................................... |
| 3. ................................ | ........................................... |
| 4. ................................ | ........................................... |

**දැනට ශිෂ්‍යයා/ශිෂ්‍යාව ඉගෙනුම ලබන විදුහලේ විදුහල්පතිගේ සහතිකය :**

12. ඉහත නම සඳහන් ශිෂ්‍යයා/ශිෂ්‍යාව මේ විදුහලේ ........................................ වැනි ශ්‍රේණියේ ඉගෙනීම ලබන/ලැබූ බවත් 200 ... වර්ෂයේ දී 12 වැනි ශ්‍රේණියේ ඉගෙනීම සඳහා ඔහුට/ඇයට සුදුසුකම් තිබෙන බවත් මෙයින් සහතික කරමි. දැනට මේ විදුහලේ ............. වැනි ශ්‍රේණියේ සිට ........ වැනි ශ්‍රේණිය දක්වා ඉගැන්වීම් කෙරෙන බවත් 12 හා 13 ශ්‍රේණිවල කලා/වාණිජ්‍ය/ජෛවීය/භෞතික විද්‍යා විෂයයන් උගන්වනු ලබන/නොලබන බවත් කාරුණික ව දන්වමි.

13. සටහන් :

.....................................
විදුහල්පතිගේ අත්සන හා නිල මුද්‍රාව

දිනය............. ................

ඉහත සඳහන් කරුණු සත්‍ය බවත් නිවැරදි බවත් විභාග ප්‍රතිඵල සනාථ කිරීම සඳහා විභාග දෙපාර්තමේන්තුවේ විභාග ප්‍රතිඵල ලේඛනය ඉදිරිපත් කිරීමට සූදානම් බවත් මෙයින් සහතික වෙමු.

.................................
ශිෂ්‍යයාගේ /ශිෂ්‍යාවගේ අත්සන

.....................................
පියාගේ/මවගේ/භාරකරුගේ අත්සන

# අ.පො.ස.(උ.පෙ.) පන්තිවලට සිසුන් ඇතුලත් කිරීම සඳහා ලකුණු දීමේ ක්‍රමය

(මෙහිදී චක්‍රලේඛයේ 6.1 වගන්තියේ ප්‍රමුඛතා අනුව සිසුන් වෙන් කර ලකුණු ලබා දිය යුතු ය.)

1. පදිංචි ව සිටින ප්‍රදේශය

ඉල්ලුම්කරු පදිංචි ව සිටින ප්‍රදේශය අනුව ලකුණු ප්‍රදානය කෙරේ.

| | | ලකුණු |
|---|---|---|
| කොට්ඨාසය තුළ | - | 10 |
| කලාපය තුළ | - | 07 |
| දිස්ත්‍රික්කය තුළ | - | 05 |
| පළාත තුළ | - | 03 |
| පළාතෙන් පිටතට | - | 01 |

(උපරිම ලකුණු 10)

(ලකුණු දීමේ දී එක් ශීර්ෂයක් සඳහා පමණක් ලකුණු දීම කළ යුතු වේ.)

2. අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී ලැබූ ප්‍රතිඵල

| | | |
|---|---|---|
| එක් විශිෂ්ට සාමාර්ථයක් සඳහා (A) | ලකුණු | 06 |
| එක් අධි සම්මාන සාමාර්ථයක් සඳහා (B) | ලකුණු | 05 |
| එක් සම්මාන සාමාර්ථයක් සඳහා (C) | ලකුණු | 04 |
| එක් සාමාන්‍ය සාමාර්ථයක් සඳහා (S) | ලකුණු | 02 |

අතිරේක විෂයයන් සඳහා එක් විෂයයකට ලකුණක් බැගින් විෂයයන් 2ක් සඳහා පමණක් ලකුණු ලබා දිය හැකි යි.

(උපරිම ලකුණු 50)

(2008 අ.පො.ස. (සා.පෙ) (නව ප්‍රතිසංස්කරණයට අනුව) විභාගය සඳහා විෂයයන් 09ක් ඇති බැවින් එම ප්‍රතිඵලයන් සඳහා ඉහත පරිදි ම විෂයයන් 09ට ම ලකුණු ලබා දී උපරිම ලකුණු 54ක් කර ගත යුතු ය. )

3. විෂය සමගාමී කටයුතු

මේ යටතේ එක් ශිෂ්‍යයකුට ලකුණු ලබා ගත හැක්කේ අධ්‍යාපන අමාත්‍යාංශය මගින් සංවිධානය/අනුමත කර විෂය සමගාමී කටයුතු 03ක් සඳහා පමණි. ලකුණු දිය යුත්තේ ජාතික හෝ පළාත් යන මට්ටම් දෙකින් එක් මට්ටමකට පමණි.

| ලැබූ ස්ථාන | 1 වන ස්ථානය | 2 වන ස්ථානය | 3 වන ස්ථානය |
|---|---|---|---|
| ජාතික මට්ටම | ලකුණු 5 | ලකුණු 4 | ලකුණු 3 |
| පළාත් මට්ටම | ලකුණු 3 | ලකුණු 2 | ලකුණු 1 |

(උපරිම ලකුණු 15)

(ලකුණු ක්‍රමයට අනුව ලකුණු සනාථ කිරීමට අදාළ වන සියලු ම ලිපිලේඛන ඉදිරිපත් කළ යුතු යි.)

දුරකථන /தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍යතුමා
அமைச்சர்
Minister } 2784832
Fax: 2784825

ලේකම්
செயலாளர்
Secretary } 2784812

කාර්යාලය
அலுவலகம்
Office } 2785141-50
Fax: 2784846

ඊමේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

ඔබේ අංකය
உமது இல.
Your No. } ......................

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

"ඉසුරුපාය"
බත්තරමුල්ල.

'இசுருபாயா'
பத்தரமுல்ல.

"Isurupaya"
Battaramulla.

මගේ අංකය
எமது இல.
My No. } පාසල් කටයුතු හා පෞද්ගලික පාසල් ශාඛාව
ඩී/01/12/10/06/01

දිනය
திகதி
Date } 2008 .05. 14

පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කොට්ඨාස භාර නියෝජ්‍ය/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
රජයේ පාසල්වල හා අනුමත පෞද්ගලික පාසල්වල ප්‍රධානීන් වෙත

## අ.පො.ස.(උසස් පෙළ) පන්තිවලට සිසුන් ඇතුළත් කිරීම

අ.පො.ස. (උසස් පෙළ) පන්තිවලට සිසුන් ඇතුළත් කිරීම පිළිබඳව නිකුත් කර ඇති 2008.04.30 දිනැති අංක 2008/17 දරණ චක්‍රලේඛය හා බැඳේ.

02 එම චක්‍රලේඛයේ වාණිජ විෂයධාරාවට ඇතුළත් වීම සඳහා අවශ්‍ය විශේෂ සුදුසුකම් ලෙස ව්‍යවසායකත්ව අධ්‍යයනයට හෝ ව්‍යාපාර හා ගිණුම්කරණය හෝ ගණිතයට හෝ සම්මාන සාමාර්ථයක් ලබා තිබිය යුතු බව සඳහන් වේ.

03 එහෙත් සමහර විදුහල්පතිවරුන්, දෙමව්පියන් පෙර වර්ෂවල මෙන් සමාජ අධ්‍යයනය විෂයයට සම්මාන සාමාර්ථයක් ලබා ඇති සිසුන්ට ද වාණිජ විෂයධාරාවට ඇතුළත් වීමට ඉඩකඩ ලබා දෙන ලෙස ඉල්ලීම් කර ඇත.

04 එම ඉල්ලීම් සලකා බලා සිසුන්ට වැඩි ඉඩ ප්‍රස්ථා ලබා දීම පිණිස 2008 වර්ෂයේ 12 වන ශ්‍රේණියේ වාණිජ විෂයධාරාවට ඇතුළත් වන සිසුන් සඳහා පමණක් 2008/17 චක්‍රලේඛයේ සඳහන් අදාල විෂයයන් වලින් එකක් හෝ සමාජ අධ්‍යයනය විෂයයට හෝ විශේෂ සුදුසුකම් ලෙස සම්මාන සමාර්ථයක් ලබා තිබීම ද පිළිගත යුතු බව තීරණය කර ඇත. එබැවින් එම තීරණයට අනුව කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

එම්.එම්.එන්.ඩී. බණ්ඩාර
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

D:chamari/colombo.doc